# One Laptop Per Child = OLPC

## "සෑම දරුවෙකුට ම ලැප්ටොප් පරිගණකයක්"

# *XO* පරිගණකය

රෂාන් අනුෂ්ක {rashan.uoc@gmail.com}

# XO පරිගණකය



# දෘඩාංග ලක්ෂණ

- 7.5" (කර්ණය හරහා) පරිගණක තිරය.
  - වර්ණ ප්‍රකාරයේදී 800X600 ප්‍රනිධිය
  - ඒකවර්ණ ප්‍රකාරයේදී  1200X900 (200 dpi) ප්‍රනිධිය
    - දැඩි හිරු එළියේ දී වුව ද පහසුවෙන් දර්ශණය වේ
- පාදමේ ඇත්තේ යතුරු පුවරුව හා බැටරිය පමණි (සාමාන්‍ය ලැප්ටොප් පරිගණකයක බොහොමයක් උපාංග පිහිටන්නේ පාදමේය)
- ජල ප්‍රතිරෝධී යතුරු පුවරුව
- හුරුබුහුටි ඇන්ටනා යුගලක් (රැහැන් රහිත සම්බන්ධතාව සඳහා)
- වීඩියෝ කැමරාවක්, මයික්‍රොපෝනයක්, ස්පීකර යුගලක්
- විශේෂ ක්‍රීඩා බොත්තම් හා දත්ත සම්ප්‍රේෂණ විධි (උදා USB, SD)
- ඉතා රළු හාවිතයකට වුව ඔරොත්තු දෙන නිමාව
- ද්විත්ව ක්‍රියාකාරී ආදාන පුවරුව

# දෘඩාංග ලක්ෂණ ...

- වැඩි දියුණු කරන ලද බැටරි රසායනයක් ($LiFePO_4$)
  - දැනට පවතින වඩාත්ම ආරාක්ෂාකාරී මෙන්ම පරිසර හිතකාමී සංයෝගයයි
  - පූර්ණ අරෝපණයකින් පසු සාමාන්‍යයෙන් පැය 5ක් වත් පරිගණකයට බලය සපයයි
  - සාපේක්ෂව වැඩි වාර ගණනක් අරෝපණය කළ හැක
- AMD ජියෝඩ් 433MHz සකසනය හා 256 MB මතකය
- සුවිශේෂී දැලැස් රැහැන් රහිත තාක්ෂණය (802.11s)
  - පරිගණකය නිවා දමා ඇති විටත් අන් පරිගණක වෙත සේවය සපයයි
- ඉතා අවම විදුලි බලයකින් ක්‍රියා කිරීම
  - උපරිම පරිභෝජනය 5W පමණ වන අතර සාමාන්‍ය පරිභෝජනය 1 W පමණ වේ (සාමාන්‍ය ලැප්ටොප් පරිගණකයක් සඳහා 10 ගුණයක පමණ බලශක්තියක් අවශ්‍ය වේ).

රෂාන් අනුෂ්ක {rashan.uoc@gmail.com}

# XO පරිගණකය භාවිතය

CC BY

රෂාන් අනුෂ්ක {rashan.uoc@gmail.com}

# පරිගණකය විවෘත කිරීම

- පරිගණකයේ XO නිරූපකය පෙනෙන පරිදි හා එහි හැඩලය ප්‍රතිවිරුද්ධ දිශාවට මුහුණලා තිබෙන පරිදි පිහිටුවන්න.



- අගුල නිදහස් වීම සඳහා පරිගණකයේ කන් යුවල (ඇන්ටෙනා) ඔසවන්න.



CC BY

# පරිගණකය විවෘත කිරීම...

- දාරය දිගේ තිරය යතුරු පුවරුවෙන් ඉහළට ඔසවන්න.





- පරිගණකය ආරම්භ කිරීම සඳහා බලගැන්වීමේ බොත්තම ඔබන්න (හදිසි අවස්ථාවන්හී දී මෙම බොත්තම තත්පර 10ක් පමණ ඔබා සිටීමෙන් පරිගණකය නිවා දැමීමට පුළුවන)



රෂාන් අනුෂ්ක {rashan.uoc@gmail.com}

# ඉ-පොත් ප්‍රකාරය


- පරිගණකය හරහා කිසියම් අන්තර්ගතයක් පහසුවෙන් කියවීම සඳහා එය පොතක් ලෙස හැකිළිය හැක.
  - අදාල බොත්තම් මඟින් අවශ්‍ය පරිදි තිරයේ දීප්තිය සකසන්න
  - තිරය පාදමට සෘජුව පිහිටන සේ සකසන්න
  - තිරය, යතුරු පුවරුවෙන් ඉවතට වන සේ 180* කරකවන්න
  - ඇන්ටෙනා යුගල හකුළුවමින් තිරය පාදමේ ස්පර්ශ වන සේ එය පහළට ගෙන එන්න



CC BY

රෂාන් අනුෂ්ක {rashan.uoc@gmail.com}

# XO යතුරු පුවරුව


1
17
16
15
14
13
12
11
2
3
4
10
7
5
6
8
9
erase
enter
ctrl
shift
fn
alt
alt gr
shift
ආදාන පුවරුව

# යතුරු පුවරුව...

1. Esc යතුර: ක්‍රියාකාරකම් වලින් ඉවත් වීම සඳහා බහුලව භාවිතා වේ (පාලක යතුර සමඟින් - Ctrl + esc)
2. TAB යතුර: වම හා දකුණ නිරූපිත ඊතල දෙකකින් ලකුණු කර ඇත. ඡේදයන්හි එබුම් සඳහා භාවිතා වේ.
3. Ctrl යතුර: වෙනත් යතුරු සමඟ එබීමෙන් විවිධ විධානයන් ලබා දිය හැක
4. SHIFT යතුර: වෙනත් යතුරු සමඟ එබීමෙන් වෙනස් ප්‍රතිඵල ලබා දේ (උදා: ලතින් මහකුරු)
5. Fn යතුර: වෙනත් යතුරු සමඟ යෙදීමෙන් විවිධ විධානයන් ලබා දිය හැක
6. Alt යතුර: වෙනත් යතුරු සමඟ යෙදීමෙන් විවිධ විධානයන් ලබා දිය හැක
7. SPACEBAR: හිස්තැන් ඇතුලත් කිරීමට භාවිතා වේ
8. Alt Gr යතුර: වෙනත් යතුරු සමඟ යෙදීමෙන් විකල්ප අක්ෂර ඇතුලත් කළ හැක
9. සර (Arrow) යතුරු: සංචාලනය සඳහා භාවිතා වේ
10. වැඩි කිරීමේ/ බෙදීමේ යතුර (ඇතැම් පරිගණක වල මෙය භාෂා මාරු කිරීමේ විශේෂ යතුරකි)
11. Enter යතුර: කිසියම් විධානයක් ස්ථිර කිරීම, නව පේළියක් එක් කිරීම
12. මකන යතුර: කිසිවක් මකා දැමීමට භාවිතා වේ
13. රාමු යතුර: දැනට ක්‍රියාත්මක වන ක්‍රියාකාරකම්, බැටරියේ තත්ත්වය, ජාල තොරතුරු ආදිය දැක්වෙන 'රාමුව' පෙන්වයි
14. ශබ්ද පාලක
15. තිරයේ දීප්තිය පාලනය කරන යතුරු
16. දර්ශන යතුරු: ිට දකුණට පිළිවෙලින්, වටපිට දසුන,සමූහ දසුන, නිවෙසි දසුන හා ක්‍රියාකාරකම් දසුන
17. සෙවුම් යතුර: ජ'නලයේ සෙවුම් කොටුව වෙතට ගෙන යයි

CC BY

රෂාන් අනුෂ්ක {rashan.uoc@gmail.com}

# යතුරු පුවරු කෙටිමං

- Ctrl + esc – ක්‍රියාකාරකමෙන් පිටවීම
- Alt +TAB – දැනට ක්‍රියාත්මක වන ක්‍රියාකාරකම් එකින් එකට මාරු වීම
- Ctrl + c – පසුරු පුවරුවට පිටපත් කිරීම
- Ctrl + v – පසුරු පුවරුවට පිටපත් කළ දෙයක් ඇලවීම
- Fn + Erase - ඉදිරියෙන් ඇති දේ මකා දැමීම
- Alt + enter – පූර්ණ තිරය වෙතට/ඉවතට යාම
- Alt Gr + j – යූරෝ සංකේතය ජනිත කරයි (යුරෝපයේ මුදල් ඒකකය)

ක්‍රියාකාරකම: මෙවැනි තවත් කෙටිමං තෝරා ලියන්න

CC BY
රෂාන් අනුෂ්ක {rashan.uoc@gmail.com}